The Journal of Studies in Humanities

Volume 6 (I) 2020

Department of Humanities, Rajarata University of Sri Lanka

# පුරාතන ලංකාවේ ගැටුම් කළමනාකරණයෙහිලා පාලකයන් විසින් අනුගමනිත උපායමාර්ග (රෝහණ පාලක පරම්පරාව ඇසුරිනි)

එන්.පී.අයි.එම්. වික්‍රමසිංහ

එම්.කේ.එල්. අයිරාංගනී මලවරගේ

***Correspondence:***
iranganimkl@yahoo.com

***Specialty Section:***
History

***Received:***
10 September 2021

***Revised:***
14 August 2022

***Accepted:***
20 August 2022

***Citation:***
වික්‍රමසිංහ, එන්.පී.අයි.එම්., මලවරගේ, අයිරාංගනී එම්.කේ.එල්. (2020). පුරාතන ලංකාවේ ගැටුම් කළමනාකරණයෙහිලා පාලකයන් විසින් අනුගමනිත උපායමාර්ග (රෝහණ පාලක පරම්පරාව ඇසුරිනි). *මානවශාස්ත්‍ර අධ්‍යයන ශාස්ත්‍රීය සංග්‍රහය.* 6(1), 79-90.
ISSN (Online): 2961-564X
ISSN (Print) : 2362 - 0706

## Abstract

Since the ancient time of Sri Lanka, conflict management has been recognized as the main task of the state as it closely associates with the governance of the state and, thereby development process, administration, economy and culture of the state. This study attempted to investigate the conflict management strategies adopted by the local rulers of Rohana. In this connection, the study specifically focused on three points – 1) identify the conflicts and their nature faced by the local rulers, 2) explore the adopted strategies to manage the conflicts and 3) study the outcomes of the adopted conflict management strategies. Ancient literary sources such as Mahavamsa, Sinhala Bodhivamsa, and Dhatuvamsa, as well as the inscriptions in the southern region of Kusalanakanda, Kirinda, and Akurugoda, and the research works carried out by later scholars, were analyzed comparatively. The study revealed that the

local rulers of Rohana have adopted various conflict management strategies for gaining, consolidating, retaining, and expanding power and, in cases where conflicts have arisen, efforts have been made to prevent the spread of those conflicts. By building religious monuments, following the policy of Dharmavijaya, and winning the loyalty of religious leaders, these local rulers have tried to gain the respectability of the rulers of Anuradhapura. Local rulers have also used the marital relationship among the rulers as a strategy to conflict management. Moreover, the powerful rulers of Anuradhapura have deployed their representatives to prevent Rohana kingdom from rising powerfully, maintaining its security. Thus, the study concluded that the conflict management strategies adopted by the rulers of the Rohana have led to improve the survivability of the local Kingdom as well as improving its unity.

Keywords: conflict management, governance, strategy, regional kingdoms.

**හැඳින්වීම**

නිශ්චිත භූමි ප්‍රදේශයක් වාසභූමිය කොටගත් මිනිස් සමූහයකින් සමන්විත සංවිධානාත්මක පරිපාලනයක් සහිත ස්වාධීන පාලන ඒකකය රාජ්‍යය යනුවෙන් අර්ථ දක්වේ. විවිධ මතධාරීන් සමූහයක් සමාජය තුළ ඒකරාශී වීම හේතුවෙන් රාජ්‍යයෙහි භෞතික, ආර්ථික, දේශපාලනික සහ සමාජීය වශයෙන් ගැටුම් ඇති වීම ස්වභාවික ක්‍රියාවලියකි. නොගැළපෙන අදහස් සහිත දෙදෙනෙකු හෝ සමූහයක් අතර ඇති පරස්පර විරෝධිතාවන් හේතුවෙන් ඇතිවන විවාදයන් හෝ ප්‍රචණ්ඩකාරී තත්ත්වයන් මෙසේ 'ගැටුම්' යනුවෙන් සරලව හඳුන්වයි. "තරග කාරී අභිලාෂයන්, විවිධ වු අනන්‍යතාවන් හා ආකල්පීය වෙනස්කම් මත පුද්ගලයින් හෝ කණ්ඩායම් අතර ඇතිවන ප්‍රතිවිරෝධතාවන් ගැටුමක් ලෙස වඩාත් පුළුල් ලෙස අර්ථ ගැන්විය හැකි ය (Schellenberg,1996: 5-9) රාජ්‍යයක් තුළ ගැටුම් ඇති වීම පාලනය කෙරෙහි බාධා-වක් වේ. එහෙයින්ම රාජ්‍ය පාලකයින් විසින් ගැටුම් ඇති වීම වළක්වා ගැනීම උදෙසාත්, ඇති වූ ගැටුම් නිරාකරණය කර ගැනීම උදෙසාත්, ගැටුම් ව්‍යාප්ත වීම හෝ වර්ධනය වීම වළක්වා ගැනීම උදෙසාත්, ගැටුම් සාර්ථකව මැඩපැවැත්වීම උදෙසාත්, එවැනි ගැටුම් නැවත නැවත ඇති වීම වළක්වාගැනීම උදෙසාත් විවිධ ක්‍රියාමාර්ග අනුගමනය කරති.

ශ්‍රී ලාංකේය ඉතිහාසය වෙත අවධානය යොමු කිරීමේ දී දේශීය රාජාණ්ඩු පාලකයින් විසින් ද සාර්ථකව ගැටුම් කළමනාකරණ උපායමාර්ගයන් අනුගමනය කල අවස්ථාවන් රාශියක් හඳුනාගත හැකි අතර ඊට අසමත් වූ පාලකයින්ගේ පැවැත්ම කෙටි කාලසීමාවකට ලඝු වී තිබේ. ආගම උපයෝගී කරගැනීම, දේශීය සහ විදේශීය රාජ තාන්ත්‍රික සබඳතා ගොඩනගා ගැනීම, රාජ්‍ය පරිපාලන කාර්යයන් විධිමත් කිරීම මෙන් ම සමාජ සංස්කෘතික

අනන්‍යතාවන් සියුම්ව හැසිරවීම ඔස්සේ පුරාතන පාලකයින් විසින් ගැටුම් කළමනාකරණය කරගෙන තිබේ. අනුරාධපුර පොළොන්නරු ආදි ප්‍රධාන රාජධානි මූලික කරගනිමින් රට එක්සේසත් කිරිමෙහිලා වෙහෙසුණු පාලකයින් බොහෝමයක් මෙසේ ගැටුම් කළමනාකරණ උපායමාර්ගයන් භාවිත කර ඇති අතර ඒ පිළිබඳ විවිධ පර්යේෂකයින්ගේ අවධානය යොමු වීම ද සුලභ කරුණකි. නමුත් අනුරාධපුරයේ වර්ධනයට සමකාලීනව නැගී ආ ප්‍රාදේශීය පරිපාලන ඒකක ගණනාවකින් සැදුම්ලත් රෝහණයේ ප්‍රාදේශීය පාලකයින්ගේ ගැටුම් කළමනාකරණ උපායමාර්ගයන් කෙරෙහි එතරම් අවධානයක් යොමු වී නැත. කුඩා පාලන ඒකක ගණනාවක් රෝහණය තුළ පැවතීමත්, එම එක් එක් ප්‍රාදේශීය පාලකයින් අනෙකා අභිබවා නැගී සිටීමට උත්සහ කිරීමත්, වරින් වර අනුරාධපුර පාලකයින් විසින් රෝහණයේ පාලනයට අතපෙවීමත් හේතුවෙන් රෝහණය ගැටුම් බහුල ස්ථානයක් වශයෙන් හඳුනාගත හැකි ය. එහෙයින්ම පුරාතන පාලකයින්ගේ ගැටුම් කළමනාකරණ උපායමාර්ගයන් අධ්‍යයනය කිරීමෙහිලා සුදුසුම ක්ෂේත්‍රයක් වශයෙන් රෝහණය පවතින අතර පූර්ව පර්යේෂකයන්ගේ අවධානය ප්‍රධාන රාජධානිය කෙරෙහි කේන්ද්‍රගත වීම තුළ රෝහණය කෙරෙහි ඇති වූ රික්තකය පූරණය කිරීමට ද එමගින් හැකිවනු ඇත.

## පර්යේෂණ ගැටළුව සහ අරමුණ

පුරාතන රාජ්‍ය පාලකයින් තම පාලන ඒකකයන් තුළ සහ එයින් පරිබාහිරව ඇති වූ විවිධ ගැටුම් කළමනාකරණය කර ගැනීමටත්, ඒවා නිරාකරණය කරගැනීමටත් විවිධ උපායමාර්ග යන් භාවිත කර ඇති අතර බොහෝ විද්වතුන්ගේ අවධානයට ලක් වී ඇත්තේ දේශයේ ප්‍රධාන රාජධානිය වූ අනුරාධපුරය කෙරෙහි පමණි. අතලොස්සක් වූ අවස්ථාවල පමණක් ප්‍රාදේශීය රාජධානියක් වූ රෝහණය වෙත පර්යේෂකයින් අවධානය යොමුකර ඇතත් ඔවුන්ගේ විෂයපථය ගැටුම් කළමනාකරණය නොවේ. ඒ අනුව රෝහණ රාජ්‍යය පසුබිම් කරගත් එම පර්යේෂණ රික්තකය පූරණය කරනු වස් පුරාතන රෝහණයේ ප්‍රාදේශීය පාලකයින්ගේ ගැටුම් කළමනාකරණ උපායමාර්ගයන් කවරේ ද යන ගැටළුව පාදක කරගනිමින් මෙම පර්යේෂණය දියත් වේ.

ගැටුම් කළමනාකරණය යනු කුමක් ද යන්න හඳුනාගැනීමත්, පුරාතන රාජ්‍ය පාලකයින් එහිදී අනුගමනය කළ උපායමාර්ග කවරේ ද යන්නත් අධ්‍යයනය කරන මෙම පර්යේෂණයේ මූලික අරමුණ වන්නේ රෝහණ පාලකයින්ගේ ගැටුම් කළමනාකරණ උපායමාර්ගයන් හඳුනාගැනීමයි. එම උපායමාර්ගයන් ක්‍රියාත්මක කළ ආකාරය, එහි සාඵල්‍යතාවය, පසුකාලීන බලපෑම් ආදිය අධ්‍යයනය කරන අතර ගැටුම් කළමනාකරණය සාර්ථකව සිදුකිරීම ඔස්සේ ඉස්මතු වූ පාලකයින් ද හඳුනාගනීයි. එමෙන් ම ගැටුම් කළමනාකරණයෙහිලා අසාර්ථක වූ පාලකයින් මුහුණ දුන් විවිධ ගැටළු හඳුනාගනිමින් නූතන පරිපාලන රටාවට එයින් ගත හැකි ආදර්ශයන් සහ ආභාසයන් උකහා ගැනීම ද උප අරමුණු අතර වේ.

## ක්‍රමවේදය

රෝහණ පාලක පරම්පරාව පදනම් කරගනිමින් ගැටුම් කළමනාකරණ විෂය වෙත අවධානය යොමු කිරීමේ දී මහාවංශය, දීපවංශය, බෝධිවංශය, ධාතුවංශය සහ වංසත්ථප්පකාසිනිය ආදී වූ පුරාතන සාහිත්‍ය මූලාශ්‍රයන් ප්‍රමුඛ දායකත්වයක් දක්වන අතර එම සාධකයන් තහවුරු කරගැන්මෙහිලා බෝවත්තේගල, කුසලාන්කන්ද, මොට්ටයකල්ලු, කොට්ටාදූමුහෙල, අකුරුගොඩ ආදී ප්‍රදේශයන්හී හමුවන සෙල්ලිපි උපයෝගී කරගත හැකි වේ. ශ්‍රී ලංකාවේ දක්ෂිණ කලාපයට වන්නට පිහිටා ඇති මැණික් ගඟ, කුඹුක්කන් ඔය ආදි ගංගා ද්‍රෝණීන්ගේ සිට ගල් ඔය දක්වා පවතින්නා වූ භූමි කලාපයෙහි භූගෝලීය පිහිටීම කෙරෙහි ද මෙහිදී අවධානය යොමු කළ යුතු වේ. සෙනරත් පරණවිතාන, සිරිමල් රණවැල්ල, හඟුරන්කෙත ධීරානන්ද හිමි, සුමනසිරි වාච්චගේ, ගණනාථ ඔබේසේකර සහ ඉෂංක මල්සිරි වැනි විද්වතුන්ගේ පර්යේෂණ ග්‍රන්ථයන් ද මෙහිලා මහඟු දායකත්වයක් දක්වන අතර එම සියළුම දත්තයන් ඓතිහාසික සංසන්දනාත්ම ක්‍රමවේදය ඔස්සේ විශ්ලේෂණය කරමින්, විස්තරාත්මක ක්‍රමවේදය ඔස්සේ විග්‍රහ කල හැකි වේ.

## ප්‍රතිඵල හා සාකච්ඡාව

ප්‍රාග් ඓතිහාසික මානව සාධකවලින් සමන්විත ඉරණමඩු තැන්පතුවට අයත් අර්ධ ශුෂ්ක සහ පහතරට වියළි කලාපීය දේශගුණික ලක්ෂණවලින් යුතු ප්‍රදේශයක් පදනම් කරගනිමින් රෝහණය හෙවත් රුහුණ යනුවෙන් ප්‍රකට දක්ෂිණ ලංකාවේ පැරණිතම ජනාවාස පද්ධතියක් ව්‍යාප්ත වී ඇත. එම ජනාවාස මුල් ඓතිහාසික යුගය තුළ ක්‍රමයෙන් වර්ධනය වෙමින් දියුණු සංස්කෘතික ලක්ෂණවලින් යුතු ප්‍රාදේශීය පාලන ඒකක බවට පත්ව ඇති අතර මැණික් ගඟ, කුඹුක්කන් ඔය, කිරිඳි ඔය, ගල් ඔය සහ මුන්දෙණි ආරු යන ගංගා ද්‍රෝණි පදනම් කරගනිමින් එම කුඩා පාලන ඒකක බොහෝමයක් විසිර තිබේ. (වාච්චගේ, 2005:55) රෝහණ රාජධානි ප්‍රදේශය ප්‍රාග් ඓතිහාසික අවධියේ පටන්ම ජනාවාසව පැවති බව බූන්දල, උඩමළල, අළුගල්ගේ සහ මිනිහාගල්කන්ද වැනි ස්ථානයන්හී හමුවන සාධක මගින් තහවුරු වන අතර පසුකාලීනව මෙම ජනාවාස ප්‍රාදේශීය පාලන ඒකක වශයෙන් වර්ධනය වී තිබේ. දේවානම්පියතිස්ස රජු විසින් ශ්‍රී මහා බෝධි රෝපණ මංගල්‍යය පවත්වන අවස්ථාවට රෝහණ ප්‍රාදේශීය පාලකයින් ද සහභාගී වී ඇති අතර බෝධි අංකුරයන් වූ දෙතිස්ඵලරුහ බෝධි වෘක්ෂයන් මාගම, කතරගම, සඳුන්ගම, විල්වල, මධ්‍යංගණය, සේරුවිල, විල්ගම්වෙහෙර සහ සිතුල්පව්ව ආදී ප්‍රාදේශීය පාලන ඒකකයන් හී ද රෝපණය කර තිබේ. (මහාවංශය, 2007:19:52-53.83) (සිංහල බෝධිවංශය, 2018:245) මේ අනුව මහින්දාගමනය සිදුවන විටත් රෝහණය ප්‍රාදේශීය වශයෙන් සංවිධානය වූ ජනාවාස පද්ධතියකින් සමන්විතව පැවති බව තහවුරු වන අතර මහාවංශය ආදී මූලාශ්‍රයන්හී එම

ප්‍රාදේශීය පාලකයින් ද "රජ" යන විරුදයෙන් හඳුන්වා ඇති හෙයින් දියුණු පාලන පද්ධතියක් ද පැවති බව තහවුරු හැකි වේ. මේ ආශ්‍රිතව හමුවන සෙල්ලිපිවල ද "රකඩ සහ උපරකඩ" ලෙසින් භාවිත කර ඇති හෙයින් මොවුන් ප්‍රාදේශීයව සංවිධානය වී සිටි බව තහවුරු වේ. (Paranavithna, 197:39-53) මහාවංශය සහ වංසත්ථප්පකාසිනිය ආදී මූලාශ්‍රයන්ට අනුව අනුරාධපුරයේ බලයට පත් මුටසිව රජුගේ පුත්‍රයෙකු වූ මහානාග කුමරු දේවානම්පියතිස්ස රාජ්‍ය සමයේ දී රාජකීයන් අතර ඇති වූ කුමන්ත්‍රණයක් හේතුවෙන් රෝහණයට පලා ගොස් මාගම රාජධානිය පිහිටුවාගෙන ඇත. (මහාවංශය, 2007:22:1-9:91) මහානාගගෙන් අනතුරුව යටාලතිස්ස, ගෝඨාභය, කාවන්තිස්ස සහ දුටුගැමුණු යන පාලකයන් මාගම රාජත්වයට පත්වන අතර කතරගම දස බෑ රජවරුන්, ගිරි නුවර අභය රජු, ලෝන නුවර මහානාග රජු සහ සේරු නුවර සිව රජු ආදී ප්‍රාදේශීය පාලකයින් පිළිබඳව ද වාර්තා වේ. අනුරාධපුර රාජධානිය බලවත්වන අවස්ථාවන්හී දී අනුරාධපුරයට අවනත වෙමින් පාලනය මෙහෙයවූ රෝහණ පාලකයින්, අනුරාධපුරයට ආක්‍රමණ එල්ල වූ විට ආරක්ෂක මධ්‍යස්ථානයක් ලෙස සංවිධානය වී ආක්‍රමණිකයන්ගෙන් අනුරාධපුරය බේරා ගැනීම උදෙසා කටයුතු කරමින් සියවස් ගණනාවක් පුරා ප්‍රාදේශීය පරිපාලන ඒකකයක් වශයෙන් පැවතුනි.

රෝහණ පාලක පරම්පරාව කේන්ද්‍ර කරගනිමින් පුරාතන පාලකයින්ගේ ගැටුම් කළමනාකරණ උපායමාර්ගයන් පිළිබඳ සාකච්ඡා කිරීමේ දී ගැටුම් කළමනාකරණය යනු කුමක් ද යන්න විග්‍රහ කරගත යුතුව ඇත. පරස්පරවිරෝධී තත්ත්වයන් හේතුවෙන් උද්ගත වන බොහෝ ගැටුම්හී අවසාන ප්‍රතිඵලය විනාශකාරී තත්ත්වයකට යොමු වීම නිරායාසයෙන් සිදුවන්නක් හෙයින් ගැටුමක් ඇති වීමට පෙර ඒ පිළිබඳ හඳුනාගැනීමට පුරාතන පාලකයන් උත්සුක වී තිබේ. තම රාජ්‍ය පසුබිමෙහි පවත්නා කාලීන තත්ත්වයන් අනුව එල්ල විය හැකි අභි-යෝගයන් පිළිබඳව පාලකයා නිරන්තර අවධියෙන් සිටිය යුතු අතර ගැටුමක් ඇති වීමේ අවකාශයක් නිර්මාණය වී ඇත්නම් වහා ඊට පිළියම් යෙදීමත්, ගැටුමක් ඇති වී පවත්නේ නම් එය ව්‍යාප්ත වීම හෝ වර්ධනය වීම වළක්වා ගැනීමත්, එම ගැටුම මැඩපවත්වා යළිත් එවන් ගැටුමක් ඇති වීම වළක්වා ගැනීමත්, ගැටුම් සඳහා හේතු වූ සාධක හඳුනාගනිමින් විශ්ලේෂණය කිරීමත් ගැටුම් කළමනාකරණය වශයෙන් පෙන්වා දිය හැකි ය. මෙසේ ගැටුම් කළමනාකරණය කිරීම දේශපාලනික වශයෙන් බල වර්ධනයට හේතු වනවා පමණක් නොව සමාජ, ආර්ථික සංවර්ධනයට ද හේතු වේ.

පුරාතන රාජ්‍ය පාලකයින් විසින් ගැටුම් කළමනාකරණය කරගැන්මෙහිලා විවිධ උපායමාර්ග අනුගමනය කර ඇති අතර ආගම භාවිත කරමින් ගැටුම් කළමනාකරණය කිරීම ඒ අතරින් ප්‍රධාන වේ. රාජත්වය ලබා ගැනීමේ දී මෙන් ම බලය ව්‍යාප්ත කිරීමේ දී ද, බලය අහිමි වූ අවස්ථාවල බලය නැවත ලබා ගැනීමට ද, ජන බලය තුලනය කර ගැනීමට ද පාලකයින්

විසින් ආගම උපයෝගී කරගෙන ඇති අතර රාජ තාන්ත්‍රික සබඳතා කළමනාකරණය කිරීම, නිලධාරීන් අතර ගැටුම් වළක්වා ගැනීම, විරුද්ධ රාජ්‍යයන් බිහි වීම වළක්වා ගැනීම ආදි කාර්යයන්හී දී ද ආගම මූලික කරගෙන තිබේ.

රෝහණයේ මුල් කාලීන ජනපදිකයන් වූ කතරගම දසබාතික පාලකයින් ගාමණී නම් පාලකයාගේ දරුවන් (ධීරානන්ද හිමි:2004:248) වශයෙන් ප්‍රාදේශීය පාලනයෙහි නිරත වී ඇති අතර ඔවුන්ට සමකාලිනව අනුරාධපුරයේ දේවානම්පියතිස්ස රාජ්‍ය පාලනයට පත්ව තිබේ. වියළි කළාපයේ පැවති පරුමකවරුන්ගේ පාලනයෙන් යුතු ප්‍රාදේශීය පාලන ඒකක අතරින් අනුරාධපුරයෙහි රාජත්වයට පත්  දේවානම්පියතිස්ස රජු බලයට පත්වීමට පෙර පටන්ම ඉන්දියාවේ අශෝක අධිරාජ්‍යයා සමග සබඳතා පවත්වමින් තම බලය වර්ධනය කරගැනීමට සමත් වී ඇත. (සිංහල සමන්තපාසාදිකා, 1996:78) එහෙයින්ම දිවයිනේ ප්‍රධාන රාජධානිය වශයෙන් වර්ධනය වන අනුරාධපුරය රෝහණයේ ප්‍රාදේශීය පාලකයින්ට ද අභියෝගයක් වි තිබේ. ක්‍රමයෙන් බලවත් වූ අනුරාධපුරය සමග ආගම ප්‍රමුඛ කොටගත් සබඳතා ඇරඹීමට මෙම පාලක දෙපාර්ශවයම උත්සහ දරා ඇත. එහි ප්‍රතිඵලයක් වශයෙන් දේවානම්පියතිස්ස රජු විසින් පැවැත්වූ බෝධි රෝපණ මංගල්‍යයට කතරගම සහ සඳුන්ගම පාලකයින් සහභාගී වන අතර ඔවුන්ට බෝධි අංකුර ද හිමි වී තිබේ. (සිංහල බෝධිවංශය, 2018:245) ඊට අමතරව මාගම, විල්වල, මධ්‍යංගණය, සේරුවිල, විල්ගම්වෙහෙර, සිතුල්පව්ව යනාදී ස්ථානයන්හී ද දෙතිස්ඵලරුහ බෝධි අංකුරයන් රෝපණය කර තිබේ. මේ අනුව අනුරාධපුරය ක්‍රමයෙන් බලවත්ව නැගී සිටිනවිට එම බලවත් පාලකයාගෙන් එල්ලවන අභි-යෝගයක් ජය ගැනීම තමන්ට අපහසු බව වටහාගත් රෝහණ ප්‍රාදේශීය පාලකයින් ඔවුන් හා සාමකාමී වීම සඳහා ආගම උපයෝගී කරගත් බව තහවුරු කරගත හැකි වේ.

අනුරාධපුරයේ සිට පැමිණෙන මහානාග යුව රජු රෝහණයට ආගන්තුකයෙකු වන හෙයින් එහි මහජන බලය දිනා ගැන්ම උදෙසා භාවිත කර ඇත්තේ ද බුදු දහමයි. මාගම ප්‍රදේශයෙහි තම පාලන මධ්‍යස්ථානය පිහිටුවා ගන්නා මහානාග රජු විසින් මහානාග විහාරය සහ උඩකඳුර විහාරය කරවන අතර තමන් බෞද්ධයෙකු බවත්, ධාර්මික වන බවත් මහජනතාව වෙත ප්‍රකාශ කිරීම පිණිස අශෝක රජුගේ සෙල්ලිපිවල ආභාසය ලබමින් සෙල්ලිපිකරණයෙහි නිතර වී තිබේ. ඔහුගේ අකුරුගොඩ සහ කිරින්ද සෙල්ලිපි ඊට උදාහරණ වේ.

"ගිජුබව බියට කාරණා වේ. සංසය වැඩි වීම ද මිසදිටුවක් නොවේ ද. ජනයා ඇල්මෙන් හා ආශාවෙන් වෙන් කල නොහැකි ද. මෙසේ සිතා රාජකීය ග්‍රාමයේ රජ තෙමේ මිසදිටු අදහස් බිඳ දැමීමේ අදහසින් නාග නම් බුද්ධිමත් යුවරජ වන මම යුවරජ කාලයෙහි බුදුන් සරණ ගියෙමි." (සෙනෙවිරුවන්, 2014:43)

යනාදී වශයෙන් තමන් උතුම් වූ බුදුන් සරණ ගිය පුද්ගලයෙකු බව ජනතාවට ඒත්තු ගන්වන මහානාර රජු තමන් එසේ බුදුන් සරණ ගියේ යුව රජෙකුව සිටියදී බව දක්වමින් තම රාජකීය උරුමය ද ඉස්මතුකර තිබේ. ඒ අනුව අනුරාධපුර බෞද්ධ පාලකයාගේ සහෝදරයා ද ධාර්මික පාලකයෙකු වශයෙන් පිළිගැනීමට රෝහණ ජනතාවට හැකි වන්නට ඇත. කිරින්ද විහාර සෙල්ලිපියේ ද උපරාජ නාග කිරින්ද මේගල් විහාරයේ දී බුදුන් සරණ ගිය බව දක්වා ඇත. තම පරම්පරාවේ බලය රෝහණය තුළ තහවුරු කරනු වස් මහානාග රජු විසින් ගත් තවත් එක් ක්‍රියාමාර්ගයක් වන්නේ ලලාට ධාතූන් වහන්සේ තමන් සතුකර ගැනීමයි. ඒ වනවිටත් අනුරාධපුර පාලකයා සතුව ශ්‍රී මහා බෝධිය සහ ථූපාරාමය යන පූජනීය වස්තූන් හිමිව පැවති අතර එසේ පූජනීය වස්තුවක් රජු සතු වීම නිසා මහජන ආකර්ශනය දිනා ගැනීමට හැකි වී තිබේ. ඒ අනුව රෝහණ පාලකයන් සතු වූ වටිනාම වස්තුව වශයෙන් බුදු රජාණන් වහන්සේගේ ලලාට ධාතුව පෙන්වාදිය හැකි ය. ඒ වනවිටත් හත්තොට්ඨ දනව්වේ මහාකාල නම් කෙළෙඹි පුත්‍රයා සතුව පැවති ලලාට ධාතුව තමන් වෙත ලබාගත් මහානාග රජු තමන්ගේ මුණුපුරෙකු විසින් ඊට ස්තූපයක් ඉදිකරවනු ඇති බවට නිමිති සපයමින් ඊට ආරක්ෂාව සළසා ඇත. (ධාතුවංශය, 2011:77-79) මෙහෙයින්ම ලලාට ධාතුව මාගම පාලයන්ගේ රාජකීය උරුමයක් බවට නිතැතින්ම පත්ව ඇති අතර රෝහණයේ සියළු ප්‍රදේශයන්හී වාසය කළ බෞද්ධයන් එය ගෞරවණීය ලෙස සළකා තිබේ. මේ අනුව තම බෞද්ධ ප්‍රතිපත්තිය පෙරටු කරගනිමින් මාගම බලයට පත් මහානාග රජුට එම බලය පාරම්පරික උරුමයක් වශයෙන් තහවුරුකර ගැනීමට ලලාට ධාතුව හිමිකර ගැනීම ඔස්සේ හැකි වූ බව තහවුරු වේ. මෙහෙයින්ම මහානාග රජු රෝහණයට ආගන්තුකයෙකු වූවත්, ප්‍රදේශීය පාලකයන් ඔහුට විරුද්ධව නැගී සිටීමට අපොහොසත් වී තිබේ.

මහානාග රජුගෙන් අනතුරුව බලයට පත්වන ඔහු පුත් යටාලතිස්සයන් ද බුදු දහම පෙරටු කොටගනිමින් තම බල ව්‍යාප්තිය සිදුකර තිබේ. යටාල ස්තූපය සහ තිස්සමහාරාමය යන විහාර යටාලතිස්ස රජු විසින් කරවන ලද බව පූජාවලියෙහි සඳහන් වේ. (පූජාවලිය, 1953:771) මෙතෙක් සාමකාමීව ධර්මවිජය ප්‍රතිපත්තියට අනුගතව සිදුකළ මාගම බල වර්ධනය වෙනත් ගැටුම්කාරී මානයකට රැගෙන ගොස් ඇත්තේ යටාලතිස්සයන්ගේ පුත් ගෝඨාභය රජු විසිනි. හෙතෙම කතරගම දසබෑතිකයන් ඝාතනය කළ බවත් එයින් සිදු වූ පාපය පිළිබඳ පසුතැවෙමින් මහවැලි ගඟ දෙපස විහාර පන්සියයක් කරවූ බවත් ධාතුවංශයෙහි දක්වා ඇත. ගෝඨාභය විහාරය, චේතිය පබ්බත විහාරය, මත්තිකාලෙන විහාරය, බීරසාල විහාරය, නාග පබ්බත විහාරය, කුම්බසේල විහාරය, චේතිය පබ්බත විහාරය, අම්බසේල විහාරය, ගෝඨපබ්බත විහාරය සහ වාලුකාතිත්ථ විහාරය ආදිය ඒ අතර වේ. (ධාතුවංශය, 2011:82-83) මේ පිළිබඳ ගැඹුරින් විමර්ශනය කිරීමේ දී එතෙක් රෝහණයේ පාරම්පරික නායකයින් ඝාතනය කිරීමට ගොඨාභය රජු පෙළඹී ඇති බව හඳුනාගත හැකි ය. රෝහණයට මෑතක දී


පැමිණි මාගම පාලකයෙකු විසින්, පාරම්පරික පාලකයින් වූ දසබාතිකයන් මරා දැමීම හමුවේ මහජනතාව නිහඬව සිටියේ යැයි අනුමාන කළ නොහැකි ය. තම නායකයින්ගේ මරණය හමුවේ ඔවුන් මාගම කෙරෙහි පවත්වාගෙන ගිය විශ්වාසය බිඳී යන්නට ඇති අතර නැවත එම මහජන බලය ලබා ගැනීම ගෝඨාභය රජුට අභියෝගයක් වන්නට ඇත. එහෙයින් තමන් අතින් සිදු වූ අපරාධයට පසුතැවෙන බව ප්‍රකට කරමින් මහවැලි ගඟ දෙපස විහාර පන්සියයක් කරවීමට හෙතෙම පෙළඹී තිබේ. මෙහි දී අවධානය යොමු කළ යුතු තවත් කරුණක් නම් එසේ විහාර පන්සියයක් කරවීම තුළ එම එක් එක් විහාරය පිහිටි ගම්මානයෙහි තම බලය පිහිටුවීමට ද ඔහු සමත් වීමයි. දසබාතිකයන් සතුව පැවති එක් එක් ගම වෙත යමින් විහාරයක් කරවීම ඔස්සේ තමන්ගේ බලය පෙන්වීම උදෙසා ආගමික ස්මාරකයක් කරවීමත්, ආගමික භක්තිය හේතුවෙන්ම මහජනතාව ගෝඨාභය රජුට ආකර්ශනය වීමත් නිතැතින්ම සිදුවන්නට ඇත. එහෙයින් උද්ගත වීමට නියමිතව පැවති ගැටුමක් වළක්වාගෙන තම බලය තහවුරු කිරීමට ගෝඨාභය රජු සමත්ව තිබේ.

කාවන්තිස්ස රජු මාගම බලයට පත්වන විට දසබාතිකයින්ගේ පාලන ප්‍රදේශ මාගමට යටත්ව පැවති අතර සේරු නුවර සිව රජු, ලෝන නුවර මහානාග රජු සහ ගිරි නුවර අභය රජු යන පාලකයන් ස්වාධීන සිට ඇත. කාවන්තිස්ස රජු ද ආගම පෙරටු කොටගනිමින් තම පාලනය ආරම්භ කරයි. ඔහුගේ දියණියන් දෙදෙනෙකුම භික්ෂුණීන් වශයෙන් සසුන්ගත වීම ඊට උදාහරණයකි. (දීපවංශය, 1970:239) ගිරිපා දනව්වේ සිදු වූ භික්ෂුවකගේ අභාවයකට සහභාගි වන කාවන්තිස්ස රජු එහි කොන්තරට්ඨක නම් විහාරයෙහි ස්තූපයක් කරවීම තුළින් එම ප්‍රදේශයෙහි තම බලය ස්ථාපිත කිරීමට සමත් වී තිබේ. (ධාතුවංශය, 2011:93) තව ද තම මුත්තණුවන් වූ මහානාග රජුගේ පූර්ව ප්‍රකාශය අනුව යමින් ලලාට ධාතුව තැන්පත් කරමින් ස්තූපයක් කරවිමට ද හෙතෙම උත්සුක වී ඇත. මෙහිදී ස්තූපය නිර්මාණය කරන ස්ථානය පිළිබඳ තීරණයකට එළඹීමේ දි හෙතෙම තෝරාගෙන ඇත්තේ තම පාලන ප්‍රදේශයෙන් බාහිරව පැවති, සේරු නුවරට අයත් ස්ථානයකි. එම ස්ථානය තෝරා ගැනීම පිණිස උපදෙස් ලබා දී ඇත්තේ ද විහාරමහා දේවියගේ සහෝදරයෙකු වූ චුල්ලපිණ්ඩපාතික තිස්ස භික්ෂුව ය. (ජිනකාලමාලී, 153) මේ අනුව රජු තමාට අභියෝගයක්ව පවතින වෙනත් රාජ්‍යයක ස්තූප කර්මාන්තය කිරීමට තීරණය කරන අතර ඊට රජ පවුල තුළින් පවා අනුබලය ලැබී ඇති බව ඉහත නම් සඳහන් භික්ෂුවගේ උපදේශයෙන් හඳුනාගත හැකි වේ. සේරු නුවර සේරුවාවිල ස්තූපය ඉදි කිරීම හේතුවෙන් සිව රජු කාවන්තිස්සයන්ට අවනත වන අතර, වක්‍රාකාරව ලෝන නුවර මහානාග රජු සහ ගිරි නුවර අභය රජු ද ඔහුට අවනත වී තිබේ. ස්තූප කර්මාන්තය අවසානයේ දී ඒ අවට ගම් දහසයක් ස්තූපයට පූජා කරන කාවන්තිස්ස රජු, ස්තූපයේ ආරක්ෂාව පෙර කී රජවරුන් වෙත පවරා තිබේ (ධාතුවංශය, 2011:93). ගිරි නුවර අතහැර සෝම නුවර තම බලය පිහිටුවාගන්නා අභය රජු ද, තම බලය

The Journal of Studies in Humanities, Volume 6 Number I, 2020
ISSN (Online): 2961-564X ISSN (Print) : 2362 - 0706

එම ප්‍රදේශයෙහි තහවුරු කරගනුවස් සොමාවතී චෛත්‍ය ඉදිකර ඇත්තේ පෙර දී ආගමික භාවිතාවේම ප්‍රතිඵලයක් වශයෙනි (ධාතුවංශය, 2011:93-95).

කාවන්තිස්ස රජුගේ අනුප්‍රාප්තිකයා වූ දුටුගැමුණු කුමරු අභිබවා පියාගේ මරණයත් සමග සද්ධාතිස්ස කුමරු රාජ්‍ය බලය ලබා ගැනීමට උත්සහ කිරීම තුළින් උත්සන්න වූ ගැටුම නිරාකරණය උදෙසා ක්‍රියාත්මක වී ඇත්තේ ද බුදු දහම ප්‍රමුඛ කොටගත් භික්ෂූණ් ය (ධාතුවංශය, 2011:93-95.) එපමණක් නොව එළාර රජු පරාජය කිරීමේ අරමුණැතිව සටන් ආරම්භ කරන දුටුගැමුණු රජු එම සටන් සඳහා භික්ෂූන්ගේ ආශිර්වාදය ලබා ගැනීමට ද, මුල්ම සටන සිදුකළ මහියංගනයෙහි පැවති ස්තූපයට නවකම් කරවීම ද මෙහිදී වැදගත් වේ (ජිනකාලමාලී, 153). ධාර්මික පාලකයෙකු වශයෙන් ප්‍රකටව සිටි එළාර රජුට එරෙහිව සටන් කිරීමේ දී බෞද්ධයින්ගේ පක්ෂපාතීත්වය තමන් සතුකරගැනීමට දුටුගැමුණු රජු එවැනි ක්‍රියාමාර්ගයන්ට එළඹී තිබේ. මේ අනුව රෝහණයේ පාලකයින් බලයට පත්වීමේ දී, බලය තහවුරුකර ගැනීමේ දී, බලය ව්‍යාප්ත කිරීමේ දී මෙන් ම මහජන සහය අහිමි වූ අවස්ථාවන්හී දී ඇති වූ හෝ ඇති විමට නියමිතව තිබූ ගැටුම් කළමනාකරණය කරගැනීම උදෙසා ආගම භාවිත කර ඇති ආකාරය අධ්‍යයනය කළ හැකි විය.




ගැටුම් කළමනාකරණ උපායමාර්ගයක් වශයෙන් පුරාතන පාලකයින් විවාහ සම්බන්ධතා ද භාවිත කර තිබේ. රෝහණයෙන් හමුවන සෙල්ලිපි පාදක කරගනිමින් අධ්‍යයනයක නිරතවන හඟුරන්කෙත ධීරානන්ද හිමියන් එම සෙල්ලිපිවල සඳහන් පුද්ගලයින්ගේ ඥාතීත්වය පහත ආකාරයට පෙළගස්වා තිබේ (ධීරානන්ද හිමි, 2004:248).

මෙහි ගමණී යනු දසබෑ රජුන්ගේ පියා බවත් අභිශවෙර හා අයතිශ යනු විහාරමහා දේවියත්, කාවන්තිස්ස රජු බවත් සෙනරත් පරණවිතානයන් විසින් පෙන්වා දී තිබේ. නමුත් එම

මතය බණ්ඩනය කරන සිරිමල් රණවැල්ලයන් අදහස් කරනුයේ මොවුන් කාවන්තිස්ස හෝ විහාරමහා දේවිය නොවන බවත්, දසබාතික පරපුරෙන් පැවත එන්නන් බවත් ය (රණවැල්ල, 2003:59). ඒ අනුව පැහැදිලි වන්නේ මාගම බලය ක්‍රමයෙන් වර්ධනය වන විට දසබාතිකයින් තම බලය රඳවාගනු වස් ඥාතීන් අතරම විවාහ සබඳතා පවත්වාගෙන ගොස් ඇති බවයි. කාවන්තිස්ස රජු විසින් ද, කැළණියේ රජ කුමරිය වූ විහාරමහා දේවිය විවාහ කරගන්නා අතර මහාවංශයෙහි මොවුන්ගේ විවාහය මුහුද ගොඩගැලීමක ප්‍රතිඵලයක් වශයෙන් සිදු වූ බවට දිගු කතාන්දරයක ස්වරූපයෙන් ගෙනහැර දක්වයි. නමුත් සීහලවත්ථුප්පකරණයේ සඳහන් වනුයේ මෙම යුවල එකට වැඩෙමින් තරුණ වියට පත් වූ බව ය (සීහලවත්ථුවේ සිංහල අනුවාදයඃ ඉතා පැරණි සිංහල බණ කතා, 2014:113). මේ අනුව මොවුන්ගේ විවාහය ද රාජ්‍යයන් දෙකෙහි බල වර්ධනයට හේතු වූ බව විග්‍රහ කළ හැකි වේ. කාවන්තිස්ස රජු තම නැගණිය වූ සෝමා දේවිය ගිරි නුවර අභය රජුට විවාහ කරදීමෙන් ද රාජ්‍යයන් දෙක අතර ඥාති සම්බන්ධතාවක් නිර්මාණය කර ගනිමින් ගැටුම් කළමනාකරණයට ක්‍රියාකර ඇත (ධාතුවංශය, 2011:91). මේ අනුව රෝහණයේ බලවත්ම රාජ්‍යය වශයෙන් නැගී සිටින මාගම, දුටුගැමුණු රජු යටතේ එක්සත් වී තිබේ.

අනුරාධපුරය ක්‍රමයෙන් බලවත් වී ශ්‍රී ලංකාවේ ප්‍රධානතම රාජ්‍යය බවට පත් වූ පසුව ද රෝහණය වරින්වර ඉස්මතු වූ අතර එය ප්‍රාදේශීය රාජ්‍යයක් වශයෙන් අනුරාධපුර පාලකයන් යටතේ පාලනය වී තිබේ. බොහෝ විට අනුරාධපුර පාලකයාගේ පුත්‍රයෙකු හෝ සහෝදරයෙකු විසින් රෝහණය පාලනය කර ඇත. නැතිනම් රජුට පක්ෂපාතී වූ නිලධාරියෙකු රෝහණයේ පාලකයා වශයෙන් නම්කර ඇත. "රෝහණ බොජක" ලෙසින් මෙම රෝහණයේ පාලකයා හඳුන්වා ඇති අතර පසුකාලීනව "ඈපා" යනුවෙන් පත්කර ඇත්තේ රෝහණයේ පාලකයායි. කාසිමොට්ටෙයි සෙල්ලිපියෙහි "මහරටිය හොනය" නම් ඇමති රෝහණ බොජක තනතුරෙහි සිටි බවට (රණවැල්ල, 2003:137-138) සාධක සපයන අතර අනුරාධපුර අවධිය මුළුල්ලේම අනුරාධපුරයේ සහයට රෝහණය ඉදිරිපත් වී ඇත. මේ අනුව අනුරාධපුර පාලකයන් රෝහණය බලවත් වීමට ඉඩ නොතැබූ බවත්, නිරතුරුවම එය ඉතා වැදගත් ප්‍රාදේශීය ඒකකයක් වශයෙන් තම හිතෛශීයෙකු යටතේ පාලනය කළ බවත් හඳුනාගත හැකි ය. එහිදී ඔවුන්ගේ අරමුණ වූයේ රෝහණයේ නැගී සිටීමකින් ගැටුම් ඇති වීම වළක්වා ගනිමින් පරිපාලනය සාමකාමීව පවත්වා ගැනීමයි.

**නිගමනය**

රාජ්‍ය පාලනයේ දී රටේ දේශපාලන, ආර්ථික සහ සමාජීය තත්ත්වයන් සමබරව පවත්වා ගනිමින් සාර්ථක පාලනයක් ගෙනයෑමේ දී ගැටුම් කළමනාකරණය කරගැනීම අනිවාර්ය වූ අතර රෝහණ ප්‍රාදේශීය රාජ්‍යයන්හී පාලකයින් ද විවිධාකාර වූ ගැටුම් කළමනාකරණ උපායමාර්ගයන් අනුගමනය කර තිබේ. තම අසල්වැසි රාජධානීන් සමග ආගමික සබඳතා

ඇතිකර ගැනීම, ආගම ප්‍රචාරය කරමින් මහජන ආකර්ශනය දිනා ගැනීම, ධර්මවිජය ප්‍රතිපත්තිය, ආගමික ස්මාරක ඉදි කිරීම ආදී වශයෙන් ආගම කේන්ද්‍ර කරගත් ගැටුම් කළමනාකරණ උපායන් මොවුන් වැඩි වශයෙන් භාවිතකර තිබේ. ඊට අමතරව අසල්වැසි රාජ්‍යයන් සමගින් විවාහ සබඳතා ඇතිකර ගැනීම තුළින් එකිනෙකා අතර විශ්වාසයක් ගොඩනගා ගැනීමටත්, එකිනෙකා වෙනුවෙන් ආරක්ෂාව සැපයීමටත් ඔවුන්ට හැකියාව ලැබී ඇත. ප්‍රධාන රාජධානිය වූ අනුරාධපුර රාජධානියේ ඉහළම තනතුරක් වශයෙන් රෝහණ පාලකයා නම්කර ඇති අතර, රාජ්‍ය පාලනයට පෙර අත්දැකීම් ලබා ගැනීම උදෙසා අධ්‍යයන ප්‍රදේශයක් වශයෙන් ද රෝහණය පාලනය කිරීමට ඔවුන් යොමු වී ඇත. මේ අනුව කුඩා ප්‍රාදේශීය රාජධානි ගණනාවක සමුච්ඡයක් වූ රෝහණය තුළ රාජ්‍ය බලයට පත් වීම, බලය රඳවා තබා ගැනීම, බලය ව්‍යාප්ත කිරීම යන අවස්ථාවන්හී ගැටුම් ඇති වීම වළක්වා ගැනිමටත්, ගැටුම් නිරාකරණය කර ගැනීමටත් එම පාලකයින් විසින් ආගමික සබඳතා, ඥාති සබඳතා සහ ප්‍රාදේශීය පාලනය වැනි උපායමාර්ගයන් යොදාගෙන ඇති බව තහවුරු කළ හැකි වේ.

## ආශ්‍රිත ග්‍රන්ථ

*දීපවංශය.* (1970). සංස්: කිරිඇල්ලේ ඤාණවිමල හිමි, ඇම්.ඩී. ගුණසේන සහ සමාගම. කොළඹ.

*ධාතුවංශය.* (2011). සංස්:නෝමන් සිරිපාල, සමයවර්ධන පොත්හල, කොළඹ.

*පූජාවලිය.* (1953). සංස්: වේරගොඩ අමරමෝලී හිමි, ඇස් ගොඩගේ සහ සහෝදරයෝ. කොළඹ.

*මහාවංශය.* (2004). සංස්: හික්කඩුවේ සුමංගල හිමි සහ වෙනත්. බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය. දෙහිවල.

*වංසත්ථප්පකාසිනී.* (2001). සංස්: අකුරටියේ අමරවංශ හිමි සහ හේමචන්ද්‍ර දිසානායක. ඇස්.ගොඩගේ සහ සහෝදරයෝ. කොළඹ.

*සිංහල බෝධිවංශය.* (2018). සංස්: නෝමන් සිරිපාල, කොළඹ: ඇස්.ගොඩගේ සහ සහෝදරයෝ. කොළඹ.

*සිංහල සමන්තපාසාදිකා.* (1996). සංස්:සුචරිත ගම්ලත් සහ ඊ.ඒ.වික්‍රමගේ. ඇස්.ගොඩගේ සහ සහෝදරයෝ. කොළඹ.

*ඉතා පැරණි සිංහල බණ කථා.* (2014). සංස්.පොල්වත්තේ බුද්ධදත්ත හිමි. බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය. දෙහිවල.

ධීරානන්ද හිමි, හඟුරන්කෙත. (2004). *රාජත්වය, රාජ්‍යය සහ ආගම.* ආරිය ප්‍රකාශකයෝ. වරකාපොළ.

රණවැල්ල, සිරිමල්. (2003). *රෝහණ රාජ්‍යයේ ඉතිහාසය.* රුහුණු විශ්වවිද්‍යාලය. මාතර

රාජපක්ෂ, දයා ශ්‍රී නරේන්ද්‍ර. (2018). ජූලි 15. *"ගැටුම් නැතිකර සාමය බලගන්වන සාම සන්නිවේදනය"*. දිනමිණ. ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය.

වාච්චගේ, සුමනසිරි. (2005). *දුටුගාමණී අභය මහරජ.* කර්තෘ ප්‍රකාශන.

සෙනෙවිරුවන්, මතුගම. (2014). *සිංහල බෞද්ධ රාජ්‍ය සම්ප්‍රදාය. සාහිත පොත් පියස.* මහරගම.

*Inscriptions of Ceylon*, *Volume I.* (1970). S. Paranavithna, Arcaeological survey Department

James A. Schellenberg, (1996). Conflict Resolution: Theory, Research and Practice, State University of New York Press, Albany.